
සිසිර දිසානායක ගී සංකල්පනා
LYRICS BY SISIRA DISSANAYAKE

SARINI DISSANAYAKE



# සරස්වතී අභිනන්දන
## SARASWATHI ABHINANDANA

සිසි වන් තුනු රූ උදුලිය
නෙතිනිඳුවර පෑ ඉඳුලිය
පුවල සුරඹ පිය දස්නී
දේවී නමෝ
සරස්වතී දේවී නමෝ

පුණ්ඩරීක පද්මාසන
අරා සිටින කලා රැජන
පොකුරු මී ලෙසින් පෙරා
පොවන්නී ය සියළු රස කලා....

නිසඟ සූර මිණි ඔපලන
යසෝ වඩන හන්ස රැජන
කිරඹ සේ දියෙන් පෙරා
සොයා දේ ය නදන් රස කලා....

හීන්දෝලි රාගය ඇසුරෙන්
තනුව හා සංගීතය : වාසනා වීරකෝන්
විශේෂ ස්තුතිය : නිමල් ජයකොඩි

සිසි - සඳ
තුනු - සිරුර
උදුලිය - බබලන
නෙතිනිඳුවර - නිල් මහනෙල් මල් වැනි නෙත්
ඉඳුලිය - දෙව්ලිය
පුවල - ප්‍රතාපවත්, පිරිපුන්
සුරඹ - දෙවඟන
පිය දස්නී - ප්‍රිය දසුන් දෙවන්නී
පුණ්ඩරීක - සුදු නෙළුම් මල්
පද්මාසන - මල් අසුන
පොකුරු මී - නෙළුම් මල් පැණි
නිසඟ - උපන්
සූර - හපන්කම්
යසෝ - කීර්තිය
මිණි - මැණික්
කිරඹ - කිරි දියර
නදන් - නිධාන

සඳක් සේ රූ සම්පත්තියෙන් බබලන,
නිල් මානෙල් මල් වැනි
නෙත් බැලුම් පෑව දෙව්ලියක වූත්
ප්‍රතාපවත් ප්‍රිය දසුන් මවන දෙව්ලියක වූත්
සරස්වතී දේවිය නමස්කාර කරමි.

සුදු නෙළුම් මල් ආසනයක් මත
වැඩ සිටින කලා රැජන
නෙළුම් මල් පැණි මෙන් වන
සියළු කලා රස පෙරා පොවන්නී ය.

ස්වභාවයෙන් පොළවෙන් ඉපදෙන
මැණික් ඔපලන්නාක් සේ, උපන්
හපන්කම් ඇති අයව ඔප කර කීර්තිය
වඩවන හන්ස රැජන දියෙන් කිරි පෙරා
දෙන්නා සේ කලා නිධානයන් සොයා දෙන්නී ය.

සිනාවි

SARINI DISSANAYAKE



## කං කං බූරූ
## KAN KAN BURU

කං කං කං කං - කං කං කං කං
කං කං බූරූ - සිං සිං නෝරූ
මං මං මං මං - මං මං මං මං
මං පොඩි කාලේ - කී කවි සින්දූ
අහමු ද යාලූ....?

බාසේ
යන්තං යන්තං - තෝරන කාලේ
අම්මා
රන් රන් රන් රන් - රන් රන් රන් රන්
රන් කිරි කට ගා - කට හඬ ගෑවේ
ඔහොමලු යාලූ.....

බාලේ
ඩිංගක් ඩිංගක් - තේරෙන කාලේ
අම්මා
සිං සිං සිං සිං - සිං සිං සිං සිං
සිංහල සින්දූ - කියලා දුන්නා
මතකයි යාලූ.....



නොකියා
යන්තං යන්නන් - එන්නන් වාලේ
හඳුනා
සං සං සං සං - සං සං සං සං
සං සංගීතේ - හැඩ රුව සොඳිනා
ගැයුවයි යාලූ.......

මව් කුස යහනේ - සැනහුන කාලේ
මව් උකුලේ - නැළවුණා කාලේ
පොඩි කාලේ - ඇසෙනා දේ
ගැයුවත් ඉහළින් - සතුටින් එලෙසින්

සිහි කර ඇඳුරන් - මියැසියෙ සුරුවන්
පිය  ගී පද්'රුත් නංවා සොඳිනේ
මව් හඬ සරයේ නළවා නිසි සේ
මගේ ම ගැයුමන් ගයනෙම් මිහිරේ

තනුව සහ සංගීතය : සහන් රන්වල
සමූහ ගායනා : රන්වල බලකාය
තනුවට අනුව ලියවිණා



## කරපිංචා කුරුපිංචී
(සමාජ අසාධාරණය)
KARAPINCHA KURUPINCHI

කරපිංචා කුරුපිංචී
බත් පිඟානෙ කොනක ඉඳන්
සුසුම් හෙළන්නී
කඳුළු සළන්නී......

ව්‍යංජනේ රස කරන්න
ගුණ සාරය පුදලා
ඇතිළිය ඇතුළේ
වින්දා වූ දුක් කරදර දැන් අමතක කරලා

සලාදයේ හැඩ බලන්න
කවුරුත් වහ වැටිලා
බත් පත මුදුනේ
රන්දාවී හැඩ වැඩ කර රස ගුණ ගැන නො බලා

තනුව හා සංගීතය : ආචාර්ය රෝහණ වීරසිංහ



## නෙරිය තියන්නේ
(අපේ දේ මතු පරපුරටත්)
NERIYA THIYANNE

දුව: නෙරිය තියන්නේ ළමා සාරියේ
කොහොම ද අම්මේ කියන්නකෝ
යන්න දහම් පාසැල්
පමා වේවි අද නම්

අම්මා: නෙරිය තියන්නේ මගේ ඔසරියේ
කොහොම ද කියලා බලන්නකෝ
යන්න දහම් පාසැල්
දුවේ මමත් එන්නම්

දුව: ඇයි අද අම්මා පන්සල් එන්නේ ?
ළමයි පිරිලා විහාර ගේ ඇතුළේ
වඳින්න බෑ අද නම්

අම්මා: වැන්දා වාගෙයි පින් අත් වෙනවා
දූල පුතාලට දන්නා තරමින්
දහම් කියා දෙන්නම්

දුව: අම්මා දන්නා සින්දුත් කියමූ
විවේකයේ දී ළමයි ආස වේවී
අත් පොළසන් දේවී

අම්මා: වෙසක් ළඟයිනේ බැති ගී ගයමූ
දූල පුතාලට සරම් මසන්නම්
නෙරිය තියා දෙන්නම්

යුග ගායනය : විශාරද නන්දා මාලනී
තනුව හා සංගීතය : ආචාර්ය රෝහණ වීරසිංහ

# ටිකිරි නංගියේ
(ඉගෙන ගන්න - හිනා වෙන්න)


TIKIRI NANGIYE

ටිකිරි නංගියේ - ටිකිරි නංගියේ
කළු ලෑල්ල එළිය වෙන්නෙ
හුණු කෑල්ල නිසා නේද ?
කළු ලෑල්ල වගෙයි මූණ
හුණු කෑල්ල හිනා අඳිනවා....

කළු කළු රැළි - කළු කෙහෙරැළි
තළෙළු නුඹට පෙණුම ගෙනෙනවා
කළු මැදෙනා කළු ලෑල්ල
වගේ නුඹත් හැඩ වැඩ වෙනවා
ඒ වුණාට කල එළියක් නෑ......

සුදු සුදු රැළි - ගවුමේ රැළි
ඉස්කෝලට පාර කියනවා
දුකින් පෙඟුණ හුණු කෑල්ල
වගේ නුඹත් අකුරු ලියනවා
ඒ වුණාට හෙට හිනැහේවී....

තනුව : කලා ශූරී ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න
සංගීතය : අග්‍රා ප්‍රේමරත්න







# සුදු දුවේ - සුදූ
## (සුදුසුකමයි - උසස්කමයි)
## SUDU DUWE - SUDU

කාන්තා පිරිස: සුදු දුවේ 'සුදූ'
සුදූ - සුදූ - සුදූ

දුව: සුදුයි ද මං අප්පච්චී
හැමෝ ම මට 'සුදූ' කියන්නේ ?

පියා: සුදු දුවේ මගේ - සුදු දුවේ මගේ
තළෙළු වුණත් සුදුයි දුවත්
හැමදාමත් හොඳ ළමයෙක් නම්

දුව: කොහොම ද මං අප්පච්චී
හොඳ ළමයෙක් වෙන්නෙ ඉතින් ?
නෑ තේරෙන්නේ - මට නෑ තේරෙන්නේ

පියා: දිරිය ගන්න - වෙහෙස වෙන්න
ලොව දිනන්න සුදුසු වෙන්න
'සුදු' වෙන්නේ සුදුසු වුණාමයි
'සුදු' වෙන්නේ සුදුසු වුණාමයි

ළමා පිරිස: දික්තලා වගේ
උසයි - උසයි - උසයි

දුව: උසයි ද මං අප්පච්චී
යාළුවො මට විහිළු කරන්නේ ?

පියා: දික්තලා වගේ - දික්තලා වගේ
උස නූනත් උසයි දුවත්
කොතැන ගියත් ඉහළ ඉඳියි නම්

දුව: කොහොම ද මං අප්පච්චී
කැපී පෙනෙන්නේ ඉහළින්
නෑ තේරෙන්නේ - මට නෑ තේරෙන්නේ

පියා: දම් රකින්න - ගුණ වඩන්න
ඉගෙන ගන්න - උසස් වෙන්න
උස වෙන්නේ උසස් වුණාමයි
උස වෙන්නේ උසස් වුණාමයි

දුව: සුදුයි ද මං ?
කාන්තා පිරිස: සුදුයි - සුදුයි - සුදුයි - සුදුයි
දුව: උසයි ද මං ?
ළමා පිරිස: උසයි - උසයි - උසයි - සුදුයි

තනුව, සංගීතය හා යුග ගායනය :
ආචාර්ය වික්ටර් රත්නායක



## අම්මා

AMMA

සමනොළ සිරසින් පායන්නේ
අම්මා - මගේ අම්මා
පසළොස්වක දා හිනැහෙන්නේ
අම්මා - මගේ අම්මා.....

සඳකඩ කැටයම් රුහිරෙන් නිමවා
තිසා වැවේ කිරි දියවර පොවලා
සුවඳැල් සුසුමින් ජීවය දුන් අම්මා
අම්මා - මගේ අම්මා.....

කොත් පෙළ දිදුලන වීරිය වඩවා
සෙල්ටැම් සහසක සවි බල රන්දා
කඳුලැල් උහුලන සන්හිඳ වන් අම්මා
අම්මා - මගේ අම්මා......

තනුව හා සංගීතය :
ආචාර්ය වික්ටර් රත්නායක

## ජාලිය - ක්‍රිෂ්ණාජිනා
(දුරු රට තනි වූ සොයුරු දම්)

JALIYA - KRISHNAJINA





නංගී: ජාලිය දෝ ඔබ ?
අයියා: ක්‍රිෂ්ණාජිනා දෝ ?
දෙදෙනා: මව් පිය තුරුළින් වෙන් වී ආ
නො රටක අකුරින් මං සොයනා

නංගී: නුහුරුයි අයියේ
මේ මඳ පවන පවා
කොහොම ද තනිවම විඳගන්නේ ?

අයියා: මේ මඳ පවනින් නො වේ ද නංගියෙ
දසන්තයේ මල් සුවඳ හමා එන්නේ ?

නංගී: විස වෙයි අයියේ
මේ මල් රේණු පවා
නා මල් සුවඳයි සිහි වෙන්නේ

අයියා: කොයි මල් සුවඳත් අගේ ය නංගියෙ
විසෙන් මිදී හොඳ සුවඳ විඳින්නේ නම්

සංගීතය: විශාරද රෝහණ ධර්මකීර්ති
යුග ගායනය: විශාරද මනීෂ විජේකෝන්

